**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) ඒඩ්ස් 09 වන වටය සංරචකය - 2015**

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) ඒඩ්ස් 09 වන වටය සංරචකයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර.) සහ ඒඩ්ස් ක්ෂය රෝගය හා මැලේරියා නිවාරණ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 පෙබරවාරි 11 දින එළඹි අංක එස්ආර්එල්-එස්11-ජී13-එච් දරන ප්‍රදාන ගිවිසුමේ 13 (බී) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය හා ව්‍යාපෘති කාලය

ප්‍රදාන ගිවිසුමට අනුව වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ශ්‍රී ලංකාවේ වර්තමානයේ අඩු එච්අයිවී ව්‍යාප්තිය පවත්වාගෙන යාම හා එච්අයිවී ආසාදිත හා බලපෑමට ලක්වූ ජන ජීවිත වල ගුණත්වය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව, එච්අයිවී/ඒඩ්ස් මැඩපැවැත්වීමේ ව්‍යාපෘතියේ 6 වන වටය හා 9 වන වටය සඳහා ඇස්තමේන්තු මුළු පිරිවැය පිළිවෙලින් එ.ජ.ඩො. 1,300,923 ක් හා එ.ජ.ඩො. 4,956,930 ක්වූ අතර ජීඑෆ්ඒටීඑම් විසින් මුළු වටිනාකම මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ව්යාපෘතියේ ඒඩ්ස් සංරචකයේ 06 වන වටය එහි කටයුතු 2008 ජනවාරි 01 දින ආරම්භ කර තිබූ අතර 2010 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය. ව්‍යාපෘතියේ ඒඩ්ස් සංරචකයේ 09 වන වටය 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට

ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ වැඩි දියුණු කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තා වල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු එකඟ වන බව සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය,

**3. මූල්‍ය ප්‍රකාශන**

**3.1 මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම එ.ජ.ඩො. 1,121,550 කට සමාන රු. 155,820,264 ක් සහ 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 635,529,391 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, පෙර වර්ෂයේ වියදම හා 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත සාරාංශ ගත කෙරේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2015 | | 2014 | | |
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 42,733 | 6,296,246 | 11,143 | 1,460,240 | 69,990,787 |
| එච්අයිවී/ ඒඩ්ස් පාලන ක්‍රියාකාරකම් | 1,078,817 | 149,524,018 | 1,008,630 | 131,686,724 | 565,538,604 |
| | **1,121,550** | **155,820,264** | **1,019,773** | **133,146,964** | **635,529,391** |

**3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

2014 සහ 2015 වර්ෂ සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තත්ත්වය පහත දැක්වේ.

| | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | | |
| විදේශ ආධාර වලින් ලද මුදල්- ප්‍රදාන (වැය විෂය-13) | 396,825 | 55,000,000 | 612,745 | 80,000,000 |
| විදේශීය ආධාර හා සබැඳී දේශීය අරමුදල්-(වැයවිෂය-17) | 79,365 | 11,000,000 | 38,297 | 5,000,000 |
| ගෝලීය අරමුදලින් සෘජු ලැබීම් | 306,020 | 42,414,408 | 70,070 | 9,148,367 |
| ටෙන්ඩර් සහ අනෙකුත් ආදායම් වලින් ලද මුදල් | - | - | 161 | 21,000 |
| වැඩසටහන් වියදම් | (1,078,816) | (149,524,018) | (697,819) | (91,107,262) |
| වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය) | (296,606) | (41,109,610) | 23,454 | 3,062,105 |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය වීම් | 82,328 | 11,410,639 | - | - |
| උපචිත සහ ගෙවිය යුතු මුදල් | 272,438 | 37,759,852 | - | - |
| විදේශ විනිමය (පාඩු)/ ලාභ | (3,450) | - | (88) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්** | **54,710** | **8,060,881** | **23,366** | **3,062,105** |

| | | | | |
|---|---|---|---|---|
| **ආයෝජන ක්‍රියාකරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් | (42,733) | (6,296,246) | (11,143) | (1,460,240) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලට භාවිතා කළ ශුද්ධ මුදල්** | **(42,733)** | **(6,296,246)** | **(11,143)** | **(1,460,240)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | | |
| භාණ්ඩාගාරය වෙත හරවා යැවූ මුදල් | (11,977) | (1,764,635) | (12,223) | (1,601,865) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලට භාවිතා කළ ශුද්ධ මුදල්** | **(11,977)** | **(1,764,635)** | **(12,223)** | **(1,601,865)** |
| **ශුද්ධ මුදල් වැඩි වීම/ (ශුද්ධ අඩු වීම)** | නැත | නැත | නැත | නැත |

**4. විගණන නිරීක්ෂණ**

**4.1. නීතී රීතී, රෙගුලාසි වලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | | මුදල් රෙගුලාසි | |
| | (i) | මුදල් රෙගුලාසි අංක 453 | පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි අංක 756 | රු.මිලියන 69.99ක් වටිනා ස්ථාවර වත්කම් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. |
| (ආ) | | ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 11.2 වගන්තිය | ජීවන වියදම් දීමනා ගණනය කිරීමේදී නිලධාරීන්ගේ වැටුප් රහිත නිවාඩු සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (ඇ) | | ගෝලීය අරමුදලේ යොමුගත කොන්දේසි අංක 3 (vi) | අවස්ථා 06 කදී සිදුකළ රු.මිලියන 8.65 ක ගෙවීම් වවුචර සමඟ ගෙවීම් තහවුරු කිරීමේ ලියකියවිලි වල මුල් පිටපත් වෙනුවට ඡායා පිටපත් ඉදිරිපත් කර තිබුණි. |
| (ඈ) | | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.11 ඡේදය | එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර ඊලග මස 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. අවස්ථා 98 කදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවූ රු.මිලියන 5.95 ක් වටිනා එකතු කළ අගය මත බදු වල විස්තර ඊට අනුකූලව දන්වා නොතිබුණි. |
| (ඉ) | | 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයිඒඅයි/2002/02 | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කළ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (ඊ) | | 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 හි 4.3.2 ඡේදය | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයට දැනටමත් දායකවූ නිලධාරීන් 09 ක් වෙනුවෙන් 2015 ජනවාරි 31 දිනට රු.මිලියන 1.19 ක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. |

**5. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**5.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන්කිරීම, වර්ෂය තුළ අරමුදල් ලැබීම්, සමාලෝචිත වර්ෂය තුළදී හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා කළ වෙන්කිරීම | වර්ෂය තුළදී අරමුදල් ලැබීම් | | අරමුදල් උපයෝජනය 2015 වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජීඑෆ්ඒටීඑම් | 4.96 | 629.46 | 1.04 | 0.70 | 97.41 | 0.70 | 97.19 | 3.30 | 431.34 |
| | **4.96** | **629.46** | **1.04** | **0.70** | **97.41** | **0.70** | **97.19** | **3.30** | **431.34** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා සිදු කළ එ.ජ.ඩො.මිලියන 4.96 ක මුළු වෙන්කිරීමෙන්, ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො. මිලියන 3.3 ක් එනම් සියයට 67 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. තවද, රු. මිලියන 1.76 කට සමාන එ.ජ.ඩො. 11,977 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී මහ භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි. කෙසේ වෙතත් රු. මිලියන 37.76 ක් වූ ගෙවිය යුතු මුදල් 2015 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.

(ආ) ඖෂධ මිලදී ගැනීමට සිදුකළ එ.ජ.ඩො. 225,621 ක වෙන්කිරීම ඇතුළුව ක්‍රියාකාරකම් 27 ක් සිදු කිරීමට සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කළ රු.මිලියන 83.81 කට සමාන එ.ජ.ඩො. 659,955 ක් අදාල කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මුළුමනින්ම උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ක්‍රියාකාරකම් 18 ක් ක්‍රියාත්මක කිරීමට වෙන්කළ රු. මිලියන 29.52 කට සමාන එ.ජ.ඩො. 232,463 ක වෙන්කිරීම් අතුරින් මුළු වෙන්කිරීම්වලින් සියයට 29 ක් නියෝජනය වන රු.මිලියන 9.45 කට සමාන එ.ජ.ඩො. 68,226 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් සිදු කළ පැහැදිලි කිරීමට අනුව, ගෝලීය අරමුදලින් අරමුදල් ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත නොකළ ක්‍රියාකාරකම් 06 ක් ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 29.88 කට සමාන එ.ජ.ඩො. 215,205 ක් වැය කර තිබුණි.

**5.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ලාභීයා -01 ලෙස රාජ්‍ය නොවන සංවිධානය සමඟද, ප්‍රධාන ලාභීයා -02 ලෙස ඉහත දක්වන ලද ක්‍රියාකාරකම් වල ප්‍රමාණවත් සම්බන්ධීකරණය හා නියාමනය කිරීමේ අරමුණු සඳහා එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2013 දී අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුමක් හා රාජ්‍ය නොවන සංවිධානයක් හරහා කාන්තා ලිංගික ක්‍රියාකාරිකයන්, සම ලිංගිකයන්, මත්ද්‍රව්‍ය භාවිතාකරන්නන් හා වෙරළාශ්‍රිතව ගැවසෙන පිරිමි ළමුන් (බීච් බෝයිස්) ආදීන් සඳහා උපදේශන හා ප්‍රතිකාර කටයුතු ව්‍යාපෘතිය විසින් සිදු කරයි. කෙසේ වෙතත් එකඟතා ගිවිසුමේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය නොවන සංවිධානයේ කාර්ය සාධනය ඇගයීම් කළ නොහැකි විය.

(ආ) සිරකරුවන් උපදේශනය සඳහා සිරගතවී සිටින සිරකරුවන්ගෙන් සමපාදස්ථ කණ්ඩායම් සෑදීමට ව්‍යාපෘතිය පියවරගෙන තිබුණු අතර සමපාදස්ථ අධ්‍යාපනය ලබා දෙන්නන් ලෙස වැඩකිරීමට සිරගත සිරකරුවන් පුහුණු කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී රු. 566,310 ක් වියදම් කර තිබුණි. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සිරගත සිරකරුවන්ගේ මුළු ගහනයෙන් උපදේශනය සඳහා සමපාදස්ථ අධ්‍යාපනය ලබාදෙන්නන් 1,350 ක් සේවයේ යෙදවීමට අපේක්ෂිත වුවද සමපාදස්ථ අධ්‍යාපනය ලබා දෙන්නන් 765 ක් පමණක් පුහුණු කර 2015 දෙසැම්බර් 31 දිනට සේවයේ යොදවා තිබුණි.

(ඇ) සිරගත ප්‍රජාව සඳහා එච්අයිවී/ඒඩ්ස් වලින් ආරක්ෂා වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපදේශකයන් විසින් 2013 මැයි වලදී බාහිර ඇගයීම් වාර්තාවක් ලබා දී තිබුණද එමඟින් සිදුකළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට නිවැරදි යාන්ත්‍රණයක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි.

## 6. මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සපයන ලද වත්කම් පිරිවිතරයන් සමඟ එකඟ වන බව තහවුරු කර ගැනීමකින් තොරව රු. මිලියන 2.48 ක පිරිවැයකට ශීතකරණ 07 ක් ප්‍රසම්පාදනය කර දීප ව්‍යාප්ත රසායනාගාර වෙත සෘජුවම බෙදාහැරීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි. සැපයුම්කරු විසින් නිකුත් කළ ඉන්වොයිසි වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය හදිසි ප්‍රසම්පාදනයන් ලෙස දේශීය වෙළඳපොලෙන් රු. මිලියන 6.15 ක පිරිවැයකට පිරිමි උපත් පාලන කොපු 1,000,000 ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වෙතත් තොග වාර්තා නිවැරදිව පවත්වාගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස අතැති තොගය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

## 7. මූල්‍ය පාලනයේ අඩුපාඩු

පහත පාලන දුර්වලතා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) බාහිර පාර්ශවයක් වෙත 2010 අප්‍රේල් 10 දින හා 2010 අගෝස්තු 19 දින පිළිවෙලින් ගෙවන ලද රු. 88,146 ක් හා රු. 551,250 ක අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. තවද, ඊට අදාල භාණ්ඩ හා සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව 2016 මාර්තු වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ඖෂධ හා අනෙකුත් තොග කළමනාකරණය මත වූ පාලනයන් ප්‍රමාණවත් පරිදි සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. විගණනයේදී පහත කරුණු අනාවරණය විය.

(i) එච්අයිවී/ඒඩ්ස් ආසාදිත පුද්ගලයින් සඳහා නිර්දේශිත පෙති 4,620 ක් 2015 ඔක්තෝබර් මාසයේදී හා දෙසැම්බර් මාසයේදී කල් ඉකුත් වී ඇතත් 2016 පෙබරවාරි වන විටත් විනාශ කිරීමට කටයුතු නොකර ඖෂධ ගබඩා වල පැවතිණි.

(ii) 2015 වර්ෂය තුළදී සමාජ රෝග (ලිංගික සංසර්ගය තුළින් ඇති වන රෝග) සායන 17 කින් උපත් පාලන කොපු 198,160 ක් හා ලුබ්රිකන්ට්ස් 3,400 ක් නිකුත් කිරීම් අවස්ථා පිළිවෙලින් 28 ක් හා 02 ක් වෙනුවෙන් ලැබීම් සනාථ කිරීම් නොලැබී තිබුණි. ඊට අමතරව ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන විසින් සිදු කළ විවිධ වැඩසටහන් සඳහා නිකුත් කළ උපත් පාලන කොපු 9,656 ක් හා පවුල් සංවිධාන කටයුතු වල නියුතු රාජ්‍ය නොවන සංවිධානයක් වෙත නිකුත් කළ උපත්

පාලන කොපු 1,668,304 ක් හා ලුබ්රිකන්ට්ස් 184, 800 කට ඒ සමඟ අනුමත කළ නිකුතු නියෝග සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති කළමනාකරණ මෙහෙයුම් කමිටු රැස්වීම් වාර්තා අනුව, ව්‍යාපෘති කළමනාකරණ මෙහෙයුම් කමිටුව විසින් යෝජනා කළ පරිදි කාල නිර්ණයන් සහිත ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති කටයුතු වලට අදාල ගනුදෙණු රේඛීය අමාත්‍යාංශ විගණන ඒකකය මඟින් විගණනය කර නොතිබුණි.